දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.
කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකකට අදාල උසාවි දඩ ආදායමට අදාල පරිපාලන ගාස්තු රු.139,502 ක් ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | වර්ෂයට අදාල වියදම් හා බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කරන විට ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයයන් අතර රු.14,942,323 ක එකතු වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගි ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | 2020 වර්ෂයේදී උපයෝගි ලේඛන පරීක්ෂා කර වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23 (ආ) වගන්තිය | පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 20 ක් සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබීමෙන් රු. 80,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | නියමිත ක්‍රියාපටිපාටියට අනුව පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි පරිසර කමිටුවලදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 2,865,210 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 7,753,004 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම , රැස්කල ආදායම හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට ගිණුමට අනුව හිඟය | ඇස්තමේන්තු ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර්31 දිනට ගිණුමට අනුව හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 3,645,700 | 3,780,745 | 4,233,672 | 3,236,035 | 3,230,700 | 3,289,025 | 4,051,498 | 3,705,905 |
| ii | කුලී | 13,750,500 | 10,320,777 | 8,377,306 | 3,714,184 | 5,955,650 | 6,083,257 | 5,645,519 | 1,929,353 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,164,200 | 1,158,625 | 1,185,125 | - | 800,000 | 819,410 | 819,410 | 96,518 |
| iv | වෙනත් ආදායම් | 68,660,000 | 163,639,561 | 133,294,851 | 91,822,717 | 55,743,600 | 59,322,822 | 55,912,973 | 37,376,957 |

2.2.2 වරිපනම් හා බදු
--------------------

(අ) වරිපනම් බදු
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 1,147,818 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 5 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.454,914 ක් ද, වසර 3 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.194,709 ක් ද පැවතුණි. හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

(ආ) අක්කර බදු
------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 2,087,290 ක් වූ අතර එහි වසර 5 ට වැඩි කාලයක සිට පැවත එන රු.1,709,733 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. |

2.2.3 කුලී
----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) කඩකුලී | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ කඩකුලී ශේෂය රු. 4,902,914 ක් වූ අතර, ඒ තුළ වසර 3 ඉක්ම වූ රු. 2,045,733 ක් ද, වසරක් ඉක්ම වූ රු.1,129,683 ක ශේෂයක් ද ඇතුලත් වී තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) බදුකුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා තල්දූව සතිපොල බදු ගත් බදුකරු විසින් නිසි පරිදි කුලී මුදල් නොගෙවීම නිසා 2019 නොවැම්බර් මස ටෙන්ඩරය අවලංගු කර තිබූ අතර ඒ වන විට හිඟහිට තිබූ බදු කුලිය රු. 333,750 ක් විය. ඉන් රු. 137,500 ක් ආරක්ෂිත ඇප තැන්පතු වලින් හිලව් කරගෙන තිබුණ ද තවදුරටත් අයවිය යුතු රු. 196,250 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර්කරු විසින් තැන්පත් කරන ලද ආරක්ෂිත ඇප මුදල අඩු කිරීමෙන් පසු තවදුරටත් අයවිය යුතු රු.196,250 ක් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.15,775,252 ක් හා මුද්දර ගාස්තු රු. 29,806,129 ක් විය. ඒ තුළ වසර 05 ඉක්ම වූ උසාවි දඩ මුදල් රු. 1,120,242 ක් ද වසර 03 ක් ඉක්මවූ මුද්දර ගාස්තු රු. 15,587,449 ක් ද ඇතුලත් වී තිබුණි. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ රු.15,775,252 ක් අයකර ගැනීමට කටයුතු කර ඇති බවත් මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු යොදා ඇති බවත් දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභා බල ප්‍රදේශයේ ප්‍රචාරන දැන්වීම් පුවරු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධව පිළියෙල කරමින් පැවති අතුරු ව්‍යවස්ථා කෙටුම්පතෙහි 20 වන වගන්තිය අනුව ව්‍යාපාරික ස්ථානයක ගාස්තු ගෙවීමකින් | ගාස්තු ගෙවීමකින් තොරව ප්‍රදර්ශනය කල හැකි එක් දැන්වීම් පුවරුවක උපරිම වර්ග ප්‍රමාණය කොතෙක්ද | අදාළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බවත් එහි 20 වන වගන්තිය නැවත මහා සභාව වෙත යොමු කිරීමෙන් සංශෝධනය කර නිවැරදි කිරීමට |

| | | |
|---|---|---|
| තොරව ප්‍රදර්ශනය කල හැකි එක් දැන්වීම් පුවරුවක උපරිම වර්ග ප්‍රමාණය කොතෙක්ද යන්න නිශ්චය කර නොතිබුණි. | යන්න නිශ්චය කළ යුතුවේ. | කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ)2010/2011 වර්ෂවලදී රැස්කළ එකතු කළ අගය මත බදු රු. 2,163,505 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර ගෙවිය යුතු ගිණුම්වල දක්වා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | එකතුකළ අගය මත බදු ගිණුමේ ශේෂය හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙහිඕවිට පොදු වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ පොදු වැසිකිලිය 2019 වර්ෂයට බදු දීමට අදාල ගිවිසුමේ කොන්දේසි අංක 08 ප්‍රකාරව මාසික ජල බිල්පත බදු ගැණුම්කරු විසින් ගෙවියයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී ජල ගාස්තු එකතුව රු. 35,136 ක් සභාව විසින් ගෙවා තිබුණි. | ගිවිසුමේ කොන්දේසි අංක 08 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් ප්‍රකාරව ටෙන්ඩර්කරු විසින් ජල බිල්පත ගෙවිය යුතු වුවත් ජල බිල්පත ගෙවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බව දන්වා ඇති බැවින් මුදල් කමිටුවේ අනුමැතිය මත සහා අරමුදලින් ගෙවීම් කළ බව දන්වමි. |
| (ආ) | 2017 හා 2018 වර්ෂයන් සඳහා සතිපොල බදු දීමට අදාල බදු ගිවිසුමෙහි කොන්දේසි අංක 10 ප්‍රකාරව ජල ගාස්තු බදුකරු විසින් ගෙවියයුතු වුවත් බිල්පත් නොගෙවීම මත ජල සැපයුම විසන්ධි කර ඇති අතර නැවත ජල සම්බන්ධතා ලබා ගැනීමේ ගාස්තු හා හිඟ ජල ගාස්තු වශයෙන් රු. 107,614 ක් සභාව ගෙවා තිබුණි. එම මුදලින් බදු කරුගෙන් තවදුරටත් අයවිය යුතු රු. 77,614 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017 සහ 2018 වර්ෂවල තල්දූව සතිපොළ ටෙන්ඩර්කරුවන්ගෙන් අයවිය යුතු රු. 77,614 ක් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. |
| (ඇ) | තල්දූව සති පොළෙහි රු.19,250 ක මාසික කසල බද්ද අය නොකිරීමට සභාව තීරණය කර තිබුණ ද ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සතිපොළ බදුකරු විසින් මාසික කුලී මුදල, ජල සහ විදුලි බිල්පත් සමඟ කසල බදු මුදලද ගෙවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බවට කළ ඉල්ලීම අනුව සභාව විසින් කසල බදු අය නොකිරීමට තීරණය කළ බව දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

----------------------------------------

නොවිසඳී ඇති නිරීක්ෂණ

----------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු 4,553 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | නෛතික ප්‍රතිපාදන අනුව 2020 ජූලි මස මහා සභාවට යොමුකර නිරවුල් කිරීමට නියමිත බව දන්වමි. |
| (ආ) | ප්‍රාදේශිය සභාව පිහිටි බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණයේ පළමු මහලේ බැංකු සඳහා කුලියට දීමට යෝජිත වර්ග මීටර් 319.5 කින් යුතු පරිශ්‍ර 3 සඳහා වැසිකිලි පහසුකම් සපයා නොමැතිවීම නිසා බැංකු සඳහා එම පරිශ්‍ර කුලියට දීමට නොහැකිව තිබුණි. ඒ අනුව රැස් කිරීමට අපේක්ෂිත රු.12,000,000 ක්වූ එක්වන් මුදල් හා වර්ෂයකට රු.366,000 බැගින් ලැබිය යුතු මාසික කුලිය අහිමිවී තිබුණි. | වැසිකිලි පහසුකම් සපයා ආදායම් උපයා ගැනිමට හෝ වෙනත් ඵලදායී කාර්යයක් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුවේ. | දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ බැංකු පරිශ්‍ර 3 ක් සඳහා වෙන් කර ඇති පරිශ්‍ර තුනෙන් එකක දෙහිඕවිට මහජන පුස්තකාලය ස්ථාපිත කර ඇති අතර තවත් එක් පරිශ්‍රයක්ද ඒ සඳහා යොදාගෙන මහජන පුස්තකාලය පුළුල් කිරීමට අදහස් කර ඇත. අනෙක් පරිශ්‍රය නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ඇති කිරීමට සැලසුම් කර ඇති බව දන්වමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දින වන විට මස් හා මාළු කඩවලින් අයවිය යුතු පැරණි හිඟ කඩකුලී රු.125,276 ක් සහ දඩ මුදල් රු. 23,787 ක් වූ අතර එයින් රු.93,980 ක් 1991 සිට 1997 දක්වා කාලයට අදාල අයවියයුතු පැරණි කඩකුලී සහ දඩ විය. | හිඟ කඩකුලී අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | මස් සහ මාළු කඩ වලට අදාළ පැරණි හිඟය අයකර ගැනීම සඳහා අදාළ ටෙන්ඩර්කරුවන්ගේ විස්තර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කල ලිපි වලට මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බව දන්වමි. |
| (ඈ) | තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලැසුම් 2019 වර්ෂය වෙනුවෙන් සකස් කර නොතිබුණි. | දිගු කාලීන සැලසුම් සකස් කළ යුතුවේ. | තිරසාර සංවර්ධන අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය වෙනුවෙන් සකස් කර ඇති බව දන්වමි. |
| (ඉ) | වාර්ෂික වත්කම් සමීක්ෂණයේදී අනවසර ඉදිකිරීම්, පදිංචිවීම්, ආදිය හදුනාගෙන තිබුණද, ඒවා ඉවත් කිරීමට/වැළැක්වීමට , මායිම් සකස් කර සුරක්ෂිත කිරීමට හා සභාවට ආදායම් උපයා ගැනීම සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් උපයා ගැනිමට කටයුතු කළ යුතුවේ. | අනවසර පතල් කැනීම් සම්බන්ධයෙන් අවිස්සාවේල්ල පොලීසිය වෙත පැමිණිලි කළ අතර ඉන් අනතුරුව අනවසර පතල් කැනීම් කටයුතු ඉවත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |